# ඉතිහාසය ලිවීම

ඉතිහාසය පිළිබඳ ව කිවයුතු ප්‍රධානම කාරණය නම් ඒ ලියැවෙන්නේ වර්තමානයෙහි බව ය. සිංහල බෞද්ධයනට මෙය අරුමයක් නොවිය යුතු ය. ඉතිහාසය පමණක් නොව අනෙක් කරුණු ද ප්‍රත්‍යක්‍ෂවන්නේ වර්තමානයෙහි ය. අපට අපේම වුවත් පෞද්ගලික ඉතිහාසය ගැන ඇත්තේ වැඩිම වුවහොත් මතකයක් පමණකි. අපට අතීතයට ආපසු යෑමට නො හැකි ය. අතීතය ගැන මතකය ද ඇතිවන්නේ වර්තමානයෙහි ය. සිංහල බෞද්ධ ඥානවිභාගයට මෙය අමුත්තක් නොවිය යුතු ය. අවුරුදු දෙදහසකට අධික කාලයක් තිස්සේ අපි එය දැන සිටියෙමු. අවුරුදු දෙදහසකට අධික කාලයක් තිස්සේ අප එය දන්නා බව ප්‍රත්‍යක්‍ෂකරන්නේ වර්තමානයෙහි බව ද අපි දනිමු.

වර්තමානයෙහි ලියැවෙන ඉතිහාසය වර්තමානයට සාපේක්‍ෂවන බව ද ඒ සමග කියැවෙයි.  වර්තමානයෙහි ලියැවෙන යන්නට වර්තමානයෙහි අර්ථකථනය කෙරෙන යන්න ද ඇතුළත් වෙයි. මෙයින් කියැවෙන්නේ සියළු කාලවලට පොදු සම්මත ඉතිහාසයක් තිබිය නො හැකිය යන්න ය. මහාවංශය කර්තෘ මහානාම හිමියන් ලියා ඇත්තේ ජනප්‍රවාදයෙහි එකල පැවති අදහස් හා ඒ අදහස්වලට දුන් අර්ථකථනයන් ය. ඒ අර්ථකථන ඒ ආකාරයෙන්ම අදට ද වලංගුයැයි අපට කිව නො හැකි ය. මෙහි අප නොදන්නා දෙයක් නැත්නම්, නොදැන කරන උපකල්පනයක් වෙයි. එදා පැවති අදහස් හා අර්ථකථන ඒ ආකාරයෙන් ම යැයි කීමේ දී අප ඉන් අදහස්කරන්නේ කුමක් ද?

මහානාම හිමියන් මහාවංශය  නමින් පොතක් දැනට අවුරුදු දෙදහසකට පමණ ඉහත දී ලියා ඇත. එය බටහිර වර්තමාන අදහසින් නම් ඉතිහාස පොතක් නො වෙයි. එයට හේතුව අවුරුදු පන්සියයකට පෙර ඉතිහාසය යනුවෙන් අනෙක් විෂයයන්ගෙන්  වෙන්කෙරුණු විෂයයක් නො වීම ය. බටහිර ඉතිහාසය නම් විෂයයේ පියා යැයි ග්‍රීකයකු බෞතීස්ම කෙරුණ ද, බටහිර ඉතිහාසය යනුවෙන් වෙනම විෂයයක් ඇතිවූයේ බටහිරයන්ගේ ඊනියා පුනරුදයට පසුව ය. මහානාම හිමියන්ට ඉතිහාසය යනුවෙන් විෂයයක් සඳහා වෙනම පොතක් පළකිරීමේ අවශ්‍යතාවක් නො වී ය.

මහාවංශයේ සෑම පරිච්ඡේදයක්ම අවසන්වන්නේ හුදී ජන පහන් සංවේගය සඳහා ලියැවුණු බව ප්‍රකාශකරමින් ය. ඒ වත්මන් බටහිර ඉතිහාස පොත් ලියන ආකෘතිය නො වෙයි. එහෙත් ඉන් කියැවෙන්නේ මහාවංශයෙහි කිසිම ඉතිහාසයක් නොමැති බව නො වෙයි. මහානාම හිමියන්ට එදා ඉතිහාසය ජනතාවගේ ජීවිතයෙන් වෙන්කර ප්‍රකාශකිරීමේ අවශ්‍යතාවක් නොතිබූ බව අද අපි කියමු. ඒ බව අද අප කියන්නේ ආවට ගියාට නොව ඒ කෘතිය හැදෑරීමෙන් හා වර්තමාන ඉතිහාස කෘතිවල ආකෘතිය අවබෝධකරගැනීමෙන් සංගතව ය.

මහාවංශයෙහි සඳහන්වන ඉතිහාසය (වෙනත් දේ සමග ද මිශ්‍ර වී ඇති) වුව ද එහි ඇත්තේ එදා ඒ පිළිබඳ කරනලද අර්ථකථනයන්ට යටත්ව ය. ඒ අර්ථකථන ඒ ආකාරයෙන්ම අප අද දන්නේ කෙසේ ද? මෙහි දී අපට කළ හැක්කේ වර්තමානයට සාපේක්‍ෂවන අයුරින් එදා තිබූ අර්ථකථන ගැන අද කතාකිරීම ය. එහෙත් එසේකිරීමේ දී සංගත භාවයක් අපි අපේක්‍ෂාකරමු. සංගතබවකින් තොරව වර්තමානයේ අදහස් පළකිරීම ඉතිහාසයට පමණක් නොව වෙනත් බොහෝ ක්‍ෂෙත්‍රවලට ද අහිතකර ය.

සිංහල බෞද්ධ ඥානවිභාගයට අනුව කළහැක්කේ වර්තමානයේ දී  ප්‍රත්‍යක්‍ෂවන ආකාරයට සංගතව කරුණු ඉදිරිපත්කිරීම ය. මෙහි දී දැනගත යුතු තවත් කරුණක් නම් කරුණු යනුවෙන් ප්‍රකාශ වෙනම නොපවතින බව ය. කරුණු ද අනෙක් ප්‍රවාද සමග බැඳී ඇත. ප්‍රවාදවලින් ස්වායත්ත වූ කරුණු යනුවෙන් කොටසක් නැත. ඒ සියල්ල එකිනෙකට බැඳී ඇත.

බටහිරයෝ ද සාපේක්‍ෂ ඥානවිභාග ගැන කතාකරති. එහෙත් ඔවුන්ගේ ඥානවිභාග සිංහල බෞද්ධ ඥාන විභාගයට ගව් ගණනකින් පස්සෙන් හා පැත්තකින් ඇත. බටහිරයන්ගේ සාපේක්‍ෂතා මතිමතාන්තර යම් යථාර්ථයක සාපේක්‍ෂ වෙයි. යථාර්ථයක් යනුවෙන් යමක් ඇතැයි කී විගස එතැන ඇත්තේ ආත්මවාදයකි. යථාර්ථය වෙනුවට ඊනියා යථය යොදාගැනීමෙන් මේ ගැටළුවෙන් මිදිය නොහැකි බව ආත්මවාදීන් වූ බටහිරයෝ නොදනිති.  බටහිරයන් අනුකරණය

© Prof. Nalin De Silva

කරන නිවටයෝ ලංකාවේ උත්පත්තිය ලදද යථය යථය යැයි පුනරුච්චාරණය කරනු හැරුණු විට වෙනත් කිසිවක් නො දනිති. සිංහල බෞද්ධ සාපේක්ෂතාව නාගර්ජුනපාදයන්ගේ සාපේක්ෂතාව ද නොව නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයකි.

අද දෙමළ ජාතිවාදීන් හා ඇතැම් කිතුණුවන් අළුත් ඉතිහාසයක් ලිවීමට උත්සාහ ගන්නා බව රහසක් නො වෙයි. මේ ඉතිහාසය ලියන්නේ, ඒ පිළිබඳ අර්ථකථන කරන්නේ වර්තමානයෙහි ය. අද පවත්නේ බටහිර සංස්කෘතික, දේශපාලන හා ආර්ථික ආධිපත්‍යයකි. ඒ ආධිපත්‍යයෙහි අවශ්‍යතාව දැනට අවුරුදු තුන්සිය පණහකට පමණ පෙර සූත්‍රගත විණි. ලන්දේසි සමයෙහි සිට  බටහිරයන්ට අවශ්‍ය වී ඇත්තේ මෙරට සිංහල බෞද්ධ සංස්කෘතියට හිමි තැන අහිමිකිරීම ය. පෘතුගීසීන්ට තිබූ අවශ්‍යතාවන්ට වඩා පැහැදිලි වෙනත් අවශ්‍යතාවක් ලන්දේසීන්ට විය. පෘතුගීසීහු තම නූතනවාදී අවශ්‍යතා පිළිබඳ සංවේදී වී යැයි සිතිය නො හැකි ය.

එහෙත් ලන්දේසීහු හා විශේෂයෙන් ම බ්‍රිතානීහු තම බටහිර ක්‍රිස්තියානි නූතනවාදී ව්‍යාපෘතිය පිළිබඳ ව සවිඥානික වූහ. ඒ සවිඥානික වීමේ ප්‍රතිඵලය වූයේ ඉතිහාසය ඔවුන්ගේ ව්‍යාපෘතියට අදාළව නැවත ලිවීම ය. සිංහල රජවරුන්ට අද නැගෙනහිර පළාත යනුවෙන් හැඳින්වෙන ප්‍රදේශයෙහි වෙරළතීරය අහිමිකිරීමේ අවශ්‍යතාව ලන්දේසීන්ට තිබුණි. ඒ සඳහා ඔවුන් උපයෝගීකරගත්තේ ඔවුන් විසින් ම මෙරටට ගෙනෙනු ලැබූ දෙමළ ගොවීන් ය. යාපනයේ දුම්කොළ වගාව සඳහා ඉන්දියාවේ අද තමිල්නාඩුව යන නමින් හැඳින්වෙන ප්‍රදේශයෙන් දෙමළ ගොවීන් ගෙනා ලන්දේසීහු ඔවුන්ට ඒ ප්‍රදේශයෙහි පළපැදියම් වීමෙහි ඉඩකඩ ලබාදුන්හ.

මේ දෙමළ ප්‍රභූවරයකු ලවාම දෙමළ ඉතිහාසයක් ලිවීමේ අවශ්‍යතාව ලන්දේසීන්ට විය. ඒ අනුව ලන්දේසීන් විසින් එක් දෙමළ කවියකුට ඉතිහාස පොතක් ලිවීම භාරදෙන ලදී. ප්‍රතිඵලය වූයේ අද අප කවුරුත් දන්නා යාල්පාන වෛපව මාලෙයි නම් කවි පොත ය. මේ පොතේ කර්තෘවරයාට මෙරට සම්ප්‍රදාය ගැනවත් කිසිම අවබෝධයක් නොතිබූ බව පැහැදිලි ය. ඉතිහාසය මිශ්‍රකරගත් විවිධ වංශකථා ලියා ඇති මෙරට සම්ප්‍රදායෙන් ආභාසය ලබාගත්තේ නම් ඒ දෙමළ කවියාට තරමක හෝ සංගත කෘතියක් නිර්මානයකිරීමේ හැකියාව ලබාගැනීමට තිබුණි. එහෙත් ඒ වන විට පරම්පරාවකට දෙකකට වඩා මෙරට ජීවත් නොවූ දෙමළ කවියකුට මෙරට සම්ප්‍රදායෙන් ලබාගත හැකි දෙයක් නොවිණි.

යාල්පාන වෛපව මාලෙයි කෘතියම යාපනයේ දෙමළ ඉතිහාසයට එතරම් කාලයක් නැති බව පෙන්වයි. පරම්පරා ගණනාවක් මෙරට වාසය කළ පවුලක තැනැත්තකු නම් ඔහු මෙරට සම්ප්‍රදායෙන් යමක් ඉගෙනගන්නවාට සැකයක් නැත. අද මෙන් නොව බටහිර අධ්‍යාපනය පැතිරී නොගිය එකල දෙමළ ජනවර්ගයට අයත් අයකු වුව ද අද ඉන්නා බමුණන් හා පුස්සන් මෙන් නොව මෙරට සම්ප්‍රදාය දැනසිටියේ නම් ඔහු ලියූ ඉතිහාසයට මහාවංශයෙන් හා අනෙක් වංශකතාවන්ගෙන් ආභාසයක් ලබාගනු ඇත. එවැනි කිසිම ආභාසයක් යාල්පන වෛපව මාලෙයි කෘතියට නොලැබීමෙන් පෙනී යන්නේ ඒ කෘතියෙහි කර්තෘ මෙරටට අළුත් පුද්ගලයකු බව ය.

යාල්පාන වෛපව මාලෙයි කෘතියට ජනප්‍රවාදයෙන් යම් යම් විකෘතිවීම් එකතු වී ඇති බව ද පැහැදිලි ය. විජය කතාව එහි ඉතාමත් අසංගත ආකාරයකින් ඉදිරිපත් වෙයි. කෙසේ වෙතත් ලන්දේසීන්ට අවශ්‍ය වූයේ අද නැගෙනහිර පළාත යැයි හැඳින්වෙන ප්‍රදේශයෙහි පාලනය සිංහල රජවරුන්ට අයිති නැති බව පෙන්වීම ය. ඒ අවශ්‍යතාව සංගත ශාස්ත්‍රීය ආකාරයකින් පමණක් නොව ලන්දේසීන්ට වුවමනා ප්‍රමාණයටවත් නො ඉටුවිය.  ඒ ඊනියා ඉතිහාසය ඔවුන්ට යොදාගත නොහැකි වූයේ ඒ මුළුනින්ම අසත්‍ය වූ බැවින් ය. සිංහල රජවරු ඒ ඊනියා ඉතිහාසය තුට්ටුවකට හෝ ගණන්ගත්තේ යැයි සිතිය නො හැකි ය. ලන්දේසීන්ට දිගින් දිගට ම සිංහල රජවරු සමග නැගෙනහිර වෙරළ සම්බන්ධයෙන් කටයුතුකිරීමට සිදුවිය.

යාල්පාන වෛපව මාලෙයි නම් බොරු මාලයෙන් පටන්ගත් ඉතිහාස ලිවීම අද එදාට වඩා සංවිධානාත්මක ව ඊනියා පර්යේෂකයන් ලවා කෙරීගෙන යයි. මේ බොරු ලියන්නන් පටන්ගන්නේ මහාවංශය වැරදි යැයි කියමින් ය. එහෙත් මහාවංශයේ බොරු යැයි ඔවුන් විසින් හැඳින්වෙන දේට එරෙහිව ඔවුන් ලියන්නේ මොනවා ද? ආර්යයන් පැමිණීමට පෙර මෙරට හා භාරතයේ විසුයේ ද්‍රවිඩයන් යැයි කීම තරම් බොරුවක් තවත් වේ ද? මොවුන්ගේ කසිකබල් තර්කයට පදනම්වන්නේ අනාර්ය සියල්ලෝම ද්‍රවිඩයෝ ය යන ද්විකොට්කව ලබාගන්නා නිගමනය ය. අනෙක් ඉතිහාස

© Prof. Nalin De Silva

ලියන්නන්ගේ වෑයම සීගිරි කාශ්‍යප රජදවස සිට මෙරට ක්‍රිස්තියානීන් සිටි බව කීම ය. මේ සියළු ර්නියා ඉතිහාසඥයන්ට ඇත්තේ එකම එක අරමුණක් පමණකි. ඒ සිංහල බෞද්ධ සංස්කෘතියට මෙරට හිමිතැන අහිමිකිරීම ය.

© Prof. Nalin De Silva